105

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2007

**ESD 1135 - පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික ඉගැන්වීම සඳහා සමෝධානිත ප්‍රවේශය**

කාලය - පැය දෙකයි.

---

දිනය - 2007.12.16 වේලාව - පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00 දක්වා

---

ප්‍රශ්න (04) හතරකට පමණක් පිළිතුරු සපයන්න.

01. i. "සමෝධානිත ප්‍රවේශය" යන සංකල්පය නිර්වචනය කරන්න.
(ලකුණු 05 යි.)

ii. ළමා සංවර්ධනයේ අංශ නම් කර එම අංශ සංවර්ධනය වන පරිදි පාඩමක් ඉගැන්විය හැක්කේ කෙසේදැයි විස්තර කරන්න.
(ලකුණු 20 යි.)

02. "සමෝධානිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක දී විෂයයේ අන්තර්ගතය විෂයයට වඩා වැදගත් ය." ඉහත ප්‍රකාශයට අනුව,

i. සමෝධානිත ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රියාවලියක ලක්ෂණ පැහැදිළි කරන්න.
(ලකුණු 10 යි.)

ii. ප්‍රාථමික පාසල් සිසුන්ගේ ස්වභාවය සමග සමෝධානිත ඉගැන්වීම්-ඉගෙනුම් ප්‍රවේශය ඔබ ගලපා ගන්නා ආකාරය විස්තර කරන්න.
(ලකුණු 15 යි.)

03. i. මුල් ළමාවියේ දරුවන්ගේ, සමාජ කථනයේ ලක්ෂණ විග්‍රහ කරන්න.
(ලකුණු 10 යි.)

ii. ළමයාට ඔහු/ඇය ගේ සමාජ කථන හැකියා සංවර්ධනය කර ගැනීමට සහයවීම සඳහා සමෝධානිත ප්‍රවේශයට අනුව ක්‍රියාකාරකම් සංවිධානය කරන ආකාරය විස්තර කරන්න.
(ලකුණු 15 යි.)

04. "මුල් ළමාවියේ දරුවන් ඉගෙනුම ලබන්නේ ක්‍රියාවෙනි."

i. ඉහත ප්‍රකාශය පැහැදිළි කරන්න.

(ලකුණු 05 යි.)

ii. ළමයින්ගේ ඉහත ස්වභාවයට ගැලපෙනසේ ගණිතය හා භාෂාව සමෝධානය කරගත් ඉගැන්වීම්-ඉගෙනුම් අවස්ථාවක් සඳහා පාඩම් සටහනක් ලියන්න.

(ලකුණු 10 යි.)

iii. ක්‍රියාවෙන් ඉගෙනුමට ළමයින් ධෛර්යමත් කිරීම සඳහා ඉහත සඳහන් පාඩම් සටහන ඔබ ක්‍රියාත්මක කරන ආකාරය රූප සටහන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 10 යි.)

05. i. "තේමා ප්‍රවේශය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිළි කරන්න.

(ලකුණු 05 යි.)

ii. පෙර පාසලේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සඳහා මෙම ප්‍රවේශය තෝරාගැනීමේදී සැලකිලිමත් වියයුතු සාධක විස්තර කරන්න.

(ලකුණු 20 යි.)

06. i. ප්‍රාථමික පාසලේ සමෝධානිත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම සඳහා 1972 හඳුන්වා දෙන ලද විෂයයන් නම් කරන්න.

(ලකුණු 05 යි.)

ii. සමෝධානිත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම විෂයයන් තෝරා ගන්නා ලද්දේ මන්දැයි පැහැදිළි කරන්න.

(ලකුණු 10 යි.)

iii. අදාළ පන්ති කාමරයක් තුළ සමෝධානිත ප්‍රවේශය ක්‍රියාත්මක කරන ලද්දේ කෙසේදැයි පරීක්ෂා කරන්න

(ලකුණු 10 යි.)

- හිමිකම් ඇවිරිණි. -